දෙවියන් වහන්සේගේ කිතුණු සභාව

අංක **F040i**

ශු. මතෙව් පිළිබඳ විවරණය: හැඳින්වීම සහ 1 කොටස

(සංස්කරණය 2.0 20220407-20220511-20220607)

ශුභාරංචි වල අනුපිළිවෙල පැහැදිලි කිරීම සහ 1-4 පරිච්ඡේදවල විවරණය.

දෙවියන් වහන්සේගේ කිතුණු සභාව
තැ.පෙ. අංක 369, වෝඩ්න්, ඒ සී ටී 2606, ඕස්ට්‍රේලියාව
විද්‍යුත් තැපැල් : secretary@ccg.org

(ප්‍රකාශන හිමිකම © 2022 වේඩ් කොක්ස්)

මෙම ප්‍රකාශයෙහි සඳහන් කරුණු වෙනස් කිරීමකින් හෝ මකාදැමීමකින් තොරව සම්පූර්ණයෙන්ම පිටපත් කර ඇත්නම්, ප්‍රකාශකයාගේ නම, ලිපිනය සහ මෙහි ප්‍රකාශන අයිතිය සඳහන් කරමින් නිදහසේ පිටපත් කර බෙදා හැරිය හැක. බෙදා හරින ලද පිටපත් ලබන්නන්ගෙන් කිසිදු ගාස්තුවක් අය නොකෙරේ. ප්‍රකාශකයාගේ හිමිකම් කඩ නොකර, මෙහි අඩංගු විවේචනාත්මක සහ විචාරාත්මක කරුණු සම්බන්ධව කෙටි සමාලෝචන ඇතුලත් විය හැක.

මෙම පත්‍රිකාව ලෝක ව්‍යාප්ත වෙබ් පිටුවෙන් ලබා ගත හැක:
http://www.logon.org සහ http://www.ccg.org

ශු. මතෙව් පිළිබඳ විවරණය: හැඳින්වීම සහ 1 කොටස

හැඳින්වීම
ශුභාරංචි පොත් එළිදැක්වුණු අනුපිළිවෙල

අනුපිළිවෙල අනුව මතෙව් යනු ශුභාරංචියේ පළමුවැන්න වන නමුත් එය අනිවාර්යයෙන්ම කාලානුක්‍රමික අනුපිළිවෙල නොවේ. එය පසුකාලීන ශුභාරංචි වලින් එකක් යැයි සිතීමට හොඳ හේතුවක් තිබේ. එහි සාම්ප්‍රදායික ස්ථානය, එය මුලින්ම ලියන ලද කෘතියක් යන තර්කයට අනුබල දෙයි. මාර්ක් විසින් ලියන ලද ශුභාරංචිය මතෙව්ට පෙර ලිවූ බවත් මතෙව් සහ ලූක් යන දෙදෙනාම මාර්ක්ගේ ශුභාරංචිය මත පදනම්ව ලිවූ බවත් බොහෝ විද්වතුන් විසින් දැන් පුළුල් ලෙස පිළිගෙන ඇත. පලස්තීන සභාව තුල පැන නැගී ගැටළු අනුව එම ලියවිලි ඒකරාශී කිරීමේදී අනිකුත් ශුභාරංචි ලිවූ කතුවරුන් ලූක් ශුභාරංචිය අනුගමනය කර ඇති බවට පිළිගැනුණි. නමුත්, කතුවරුන් එලෙස එකිනෙකා කෙරෙහි බලපෑමක් ඇති කර ඇති බවට ප්‍රකාශ කිරීමට තරම් සාක්ෂි ඇති බව සඳහන් කිරීමට අපහසුය. පුරාවිද්‍යාත්මකව තහවුරු වී ඇති කරුණු අනුව මෙම අනුපිළිවෙල මාර්ක්, ලූක්, මතෙව් සහ යොහාන් යැයි සැලකේ. ග්‍රාන්ට් සලකන්නේ ඒවා

සමහරවිට ක්‍රි.ව. 90-115 අතර කාලයේ ලියා ඇති ඒවා විය හැකි බවයි. (බයිබලයේ පරිවර්තක ශබ්දකෝෂය සසඳා බලන්න - මතෙව් ගේ ශුභාරංචිය, 3 වන වෙළුම, 302 පදය හා එයට පසු පදය). මෙය වැරදි යයි සලකන්නේ මතෙව් හෙබ්‍රෙව් භාෂාවෙන් ලියා ඇති අතරම බොහෝ විට දේවමාළිගාව විනාශ වීමට පෙර ලියා ඇති බැවිනි. නොඑසේනම් එහි අර්ථවත් භාවය වටිනාකමින් සුළු එකක් වන්නට ඉඩ තිබුණි. යොහාන් ශුභාරංචිය ලියවී ඇත්තේ පත්මොස් දූපතේදී එළිදරව් පණිවිඩය ප්‍රකාශ වන්නට පෙර වේ. මාර්ක් සහ ලූක් ලියා ඇත්තේ මතෙව් ලියවිල්ලට පෙර වන අතර ඒ නිසා සියල්ල ලියා බෙදා හැර ඇත්තේ ක්‍රි.ව. 70 දී දේවමාළිගාව වැටීමට පෙර විය හැකිය. පසුකාලීන විද්වතුන් විසින් එය පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමට යෙදුන කරුණ වූයේ ජෝනාගේ ලකුණ සහ ශුභාරංචියේ ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රකාශයන්, අනාවැකි ලෙස පිළිගැනීමට ඇති අකමැත්තයි.

ග්‍රාන්ට් පවසන්නේ ඉරේනියස්ගේ කාලයේ සිට (ca ක්‍රි.ව. 180 (මිථ්‍යාදෘෂ්ටික III, 11.8ට එරෙහිව) මෘගයන් හතර දෙනා ශුභාරංචි හතරේ අපෝස්තුළුවරුන්ට සම්බන්ධ කර ඔහුට පෙර වසර තිහකට වැඩි කාලයක සිට මෙම ධර්ම න්‍යායන් සම්බන්ධ කර ඇති බවයි. ඔහු ඔවුන් සමඟ දේව දූතයන් හතර සම්බන්ධ කරයි. මෙය පසුකාලීන ක්‍රමයේ ප්‍රබන්ධයක් වන අතර එය විය නොහැක්කකි.

මතෙව් පළමු ශුභාරංචිය ලෙස පිළිගැනෙන සාම්ප්‍රදායික න්‍යාය රඳා පවතින්නේ යුසීබියස් විසින් උපුටා දක්වන ලද පැපියස්ගේ (2වන සියවස) ප්‍රකාශය මතයි (සභා ඉතිහාසය. III, 39.16). මතෙව්, හෙබ්‍රෙව් භාෂාවෙන් ලියා ඇති බව වාර්තා වී ඇති අතර ඔහු ලියූ දෙයට අදාළව භාවිතා කරන යෙදුම ලොජියන් නොහොත් ඔරකල්ස් ලෙස හැඳින්වේ. මතෙව්ගේ ශුභාරංචිය එබියොනයිට්ස් වැනි සමහරුන් විසින් පරම ලෙස භාවිතා කරන ලද අතර එමගින් ඔවුන් ගෙන් දේවධර්මීය වැරදි ඇති විය.

එවුසේබියස් සඳහන් කරන අන්දමට පැපියස් විසින්ම ඔහුගේ ලේඛනවල, මතෙව්ට පෙර මාර්ක්ගේ ශුභාරංචිය පිළිබඳව සාකච්ඡා කරන අතර බොහෝ විද්වතුන් විසින් මෙම කරුණ වැරදි අන්දමින් නොසලකා හරින ලද අතර ග්‍රාන්ට් මෙම කරුණ (303 පිටුවේ 2 වන තීරුව) සටහන් කර ඇත. මෙම වැරදි මතය ඔගස්ටින් විසින් අනුගමනය කරන ලද අතර එය සභාවේ පොදු මතය පසාරු කළේය.

ශුභාරංචි අනුපිළිවෙල ස්ථානගත කිරීම පිලිබඳ තවත් සාක්ෂි රැවීනා හි සැන් විටාලේ දේවස්ථානයෙන් පිටත ගල්ලා ප්ලැසිඩියා සොහොන් ගෙයෙහි ඇති කැටයම් චිත්‍ර වලින් හමු වේ. ඇය බටහිර අධිරාජ්‍යයා වූ හොනොරියස් අධිරාජ්‍යයාගේ සහෝදරියයි. ඇය ඉතා වික්‍රමාන්විත වූ නමුත් ඇගේ සොහොන් ගෙය ඉදිකර අවසන්වූ පසු ඉතා කෙටි කලක් තුල මිය ගියාය. මෙම කැටයම් චිත්‍රයන්හි කාල වකවානුව ක්‍රි.ව. 440 CE වන අතර මෙම චිත්‍රයෙහි ඇලවෙන කරක් සහිත කුඩා පෞරාණික පොත් පෙට්ටියක් ඇත. චිත්‍රය මගින් පෙන්වන ශුභාරංචිය වන්නේ:
මාකස් ලූකස්
මත්තියස් ඉයෝනිස්

මෙය කර ඇත්තේ ක්‍රි.ව. 325දී නයිසීය සම්මන්ත්‍රණයේ සිට ශතවර්ෂයකට පමණ පසු කාලයක සහ ක්‍රි.ව. 431දී එපීසයේ කවුන්සිලයෙන් වසර නවයකට පසුවය. මෙම චිත්‍රය මගින් මාර්ක් පලමුවෙන්න යනුවෙන් සඳහන් පැපියස් ගේ ප්‍රකාශය නොසලකා හරිමින්, පැපියස්ගේ කෘතිය මත පදනම්ව ඔගස්ටින් විසින් අනුමාණ කරන ලද පොදු පිළිගැනීම පෙරදාතම් කර ඇත. ඔහු උපකල්පනය කළේ මුලින්ම මතෙව් පැමිණ පසුව ඔහුගේ ලියවිලි කෙටිකර ලියූ මාර්ක් සහ පසුව ලූක් සහ යොහාන් ලියවිලි පැමිණි බවයි. යථාර්ථය වූයේ මාර්ක් ලියවිල්ල මතෙව්ට පෙරාතුව සහ මතෙව් විසින් මාර්ක් ලියන ලද්ද පුළුල් කර හෙබ්‍රෙව් භාෂාවෙන් ලියා කුඩා ආසියාවට යවා ග්‍රීක, ඇරමයික් සහ පසුව අරාබි භාෂාවට පරිවර්තනය කිරීමයි. ඉන්දියානු සභාව ආරම්භ කරමින් එය ඉන්දියාවටද ගෙන යන ලදී (*122D* බලන්න).

අත්පිටපත් වලින් ලබාගත් අනිකුත් ලැයිස්තු මගින් වෙනස් ආකාරයේ උත්පාදනයන් එනම්, වැදගත්කම අනුව අපොස්තුළුවරයාගේ නම ප්‍රථමයෙන් තැබීමේ ඊජිප්තුවේ ක්‍රි.ව. 300 ක්ලෙමන්ට් ලැයිස්තුව වැනි ලැයිස්තු වල මතෙව්, යොහාන් මාර්ක් සහ ලූක් ලෙස පෙන්වයි. 1885 දී මොම්සෙන් විසින් සොයා ගන්නා ලද චෙල්ටන්හැම් ලැයිස්තුව ලෙස හඳුන්වන මෙය, සමහර විටක ක්‍රි.ව. 360 උතුරු අප්‍රිකාවේ සිට පැමිණෙන මොම්සෙන් ලැයිස්තුව ලෙසද හැඳින්වේ.

කෙසේ වෙතත්, රැවීනා හි ගල්ලා ප්ලැසිඩියා සොහොන් ගෙයෙහි ඇති චිත්‍ර වලින් ආරක්ෂා කරන ලද අනුපිළිවෙල ඔගස්ටින්ගේ පසුකාලීන අනුමානයෙන් බලපෑමට ලක් නොවී සභාවේ පැරණි ඉතාලි සම්ප්‍රදායෙන් ලබාගෙන ඇති බව පෙනේ. එය ලියොන්හි ඉරේනියස්ගේ අදහස් මගින් සනාථ වේ. ඉරේනියස් කුඩා දරුවෙක් ලෙස, යොහාන්ගේ පාමුල රැඳෙමින්, ක්‍රිස්තුස් වහන්සේව හඳුනන අය සමග කතා කළේය. ඔහුව පොලිකාප් විසින් සහ පසුකාලීන ගෝලයන් විසින් පුහුණු කරන ලදී.

වෙනත් තහවුරු කිරීම් සොයා ගත හැක්කේ වැනීසියේ විශේෂ අධ්‍යයන සඳහා වූ උසස් පාසැලේ ඩෙලා ප්‍රසෙන්ටසයින් හි සිවිලිමෙහි නිර්මාණය කර ඇති මුද්‍රාව මගිනි. එහිද එම අනුපිළිවෙලම ආරක්ෂා කරන බව පෙනේ. (ග්‍රාන්ට්, 303 වන

පිටුව). ග්‍රාන්ට් තම ප්‍රබන්ධයට සහාය දැක්වීම සඳහා තවත් සාක්ෂි ඉදිරිපත් කරන අතර මුල් රෝම අදහස මෙම පිළිවෙල ආරක්ෂා කර ඇති බව තරමක් පැහැදිලිය.

මතෙව් මුල්ම ශුභාරංචිය යන සාම්ප්‍රදායික න්‍යාය යුසීබියස් විසින් උපුටා දක්වන ලද පැපියස්ගේ ප්‍රකාශය මත රඳා පවතී (සභා ඉතිහාසය. III. 39:16). "මතෙව් හෙබ්‍රෙව් උපභාෂාවෙන් ලොජියා [ඔරකල්] සම්පාදනය කළ අතර සෑම කෙනෙකුම තමන්ට හැකි උපරිමයෙන් ඒවා අර්ථකථනය කළේය." මෙම මතය මත ඒවා සියල්ලම සංක්ෂිප්ත කර හෝ සුදුසු යැයි පෙනෙන පරිදි විස්තර කර ඇත. යොහාන් ශුභාරංචිය සහ අනිකුත් ශුභාරංචි අතර ඇති වෙනස්කම් අනුව මෙය විය නොහැකි ය.

කිතුනුවන්ගේ ශුද්ධ ලියවිලි හෝ බයිබල් පොත් එකතුව ගොඩනැගීම සහ දේවානුභාවය ලත් පාඨයක් ලෙස එහි නිල පිළිගැනීම *බයිබලය (අංක 164)* යන පාඨයෙහි ලැයිස්තුගත කර ඇත. මෙම ශුද්ධ ලියවිලි හෝ බයිබල් පොත් එකතුව සකස් කිරීමෙන් පසු ත්‍රිත්වය පිලිබඳ උපකල්පනය (164C, 164F සහ 164G කියවා බලන්න) ස්ථාපිත කිරීම සඳහා බොහෝ ව්‍යාජ සහ වැරදි පරිවර්තන සිදු කරන ලද අතර වඩාත්ම ව්‍යාජ, වෙනස් කිරීම් සහ වැරදි පරිවර්තනයන් සහිත අවසාන ප්‍රතිඵලය වූයේ එල්සෙවිර් සහෝදරයන්ගේ ටෙක්ටස් රෙසිප්ටස් වූ අතර ජේම්ස් රජතුමාගේ අනුවාදය එහි නරකම ප්‍රතිඵලය විය. ජේම්ස් රජතුමාගේ අනුවාදය මත සම්පූර්ණ විශ්වාසය තැබීම කිසිදා සම්පූර්ණ හෝ නිසි අවබෝධයක් ඇති නොකරයි. එය භාවිතා කිරීමට නම්, යමෙකු මෙහි පාද සටහන් සමඟ බුලින්ගර්ගේ සහායක බයිබලය භාවිතා කිරීම වැදගත් වේ.

සෑම ශුභාරංචියකටම අරමුණක් ඇත. ඇත්ත වශයෙන්ම සමහර විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇති පරිදි, මතෙව්ගේ ශුභාරංචිය රාජකීය පෙළපත තීරණය කිරීමට නොව, දෙවියන් වහන්සේගේ ඍජු මැදිහත්වීමකින් තොරව ක්‍රිස්තුස් වහන්සේට ඊශ්‍රායලයේ සහ ජුදා දේශයේ රජු වීමට නොහැකි වූයේ මන්දැයි පෙන්වීමට ය. දෙවියන් වහන්සේගේ ඍජු මැදිහත්වීමකින් තොරව කොනියාගෙන් පැවත එන්නෙකුට ඊශ්‍රායෙලයේ සිංහාසනය මත හිඳීමට නොහැකි විය (*මෙසියස්ගේ පෙළපත (අංක 119)* බලන්න). මෙම පෙළපත, මතෙව්හි සඳහන් ජෝසප් ගේ සහ ලූක් 3 පරිච්ඡේදයේ සඳහන් ක්‍රිස්තුස් වහන්සේගේ මව වන මාරියම් යන දෙදෙනාගේම වේ. හෙබ්‍රෙව් සහ ක්‍රිස්තියානි විද්වතුන් විසින් එය මාරියම්ගේ පෙළපත ලෙස පුළුල් ලෙස පිළිගැනේ. ග්‍රීකයන් විසින් සම්ප්‍රදායකව භාර්යාව ගැන සඳහන් නොකරන පෙළපත් නාමයන් අනුගමනය කලත් ස්වාමිපුරුෂයාගේ නමට සම්ප්‍රදායික ව්‍යාකරණමය අතපසු වීම යොදමින් එමඟින් ස්ත්‍රිය ලැයිස්තුගත කර ඇති බව හැඟෙන්නට සලස්වයි. ඇරිස්ටෝබූලස් (*අංක 122D*) විසින් පිහිටුවන ලද බ්‍රිතාන්‍යයේ සෙල්ටික් සභාවේ ඉතිහාසය වේල්සය හරහා ගෙන යාමේදී, බ්‍රිතාන්‍යයේ බ්‍රැන් රජතුමා, බ්‍රිතාන්‍යයන් සමඟ ලෝහ වෙළඳාම් කෙරූ යුදෙව්වෙකු වූ අරමතියාහි ජෝසප්ගේ දියණිය වන ආනා සමඟ විවාහ වූ බව පෙන්නුම් කරයි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කන්‍යා මවගේ ඥාති සොහොයුරිය සමඟ විවාහ වී සිටි නිසාත්, අරමාතියේ ජෝසප්, කන්‍යාවගේ මාමා සහ මෙසියස්ගේ ලොකු මාමා කෙනෙකු වූ නිසාත් බ්‍රැන් රජතුමා, ආශිර්වාද ලත් බ්‍රැන් ලෙස නම් කරන ලදී. එම කාරණය නිසා, කැන්ට්යේ සහ කැටවේලවුනිහි රජු වූ කැරඩොග්ගේ සහෝදරයා වූ සිලුරියන්වරුන්ගේ රජු වන අර්විරගස්, බ්‍රිතාන්‍යයේ ග්ලාස්ටන්බරි හි සභාව පිහිටුවීමට හයිඩ් 12 ක (හයිඩ් 1ක් අක්කර 120 කට ආසන්න වේ) ඉඩමක්, නීතියෙන් ඔහුගේ සීයා වූ ජෝසප්ට සහ ඔහුගේ බෑණාවූ, පසුකලෙක ක්‍රිස්තුස් වහන්සේ තුලින් පූජකත්වය ලැබූ රෝමයේ පළමු රදගුරුවරයා වූ ලීනස් ඇප් කරාඩොග් ට ලබා දුන්නේය. මේ අනුව, එක්සත් රාජධානියේ සිටින මෙම රජවරුන්ගෙන් පැවත එන සෑම කෙනෙකුම ක්‍රිස්තුස් වහන්සේගේ පවුලේ සාමාජිකයන් වේ. යුරෝපීයයන් විසින් මෙම ඉතිහාසය නිෂේධ කර දැමීමට බොහෝ දේ කර ඇති නමුත් වේල්සය එය අත් නෑර තබාගෙන ඇති අතර කරුණු හොඳින් ලේඛනගත කර පුළුල් අන්දමින් සහතික කර ඇත. (එසේම, ඇෂ්ලි. එම්, බ්‍රිතාන්‍ය රජවරුන්ගේ සහ රැජිනියන් සම්බන්ධ අතිවිශාල පොත, කැරොල් සහ ග්‍රාෆ් ප්‍රකාශකයෝ, 1998/9 බලන්න). මෙම අදහස තහවුරු වීම සඳහා පිලාත් විසින් ක්‍රිස්තුස් වහන්සේගේ දේහය ඔහුගේ සොහොන් ගෙය තුළ තැබීම සඳහා යෝසේප්ට ලබා දීම යන කරුනද බලපා ඇති අතර යෝසේප්ගේ සහෝදරයා වූ හේලි මියගොස් සිටි නිසා ඔහු ඒ වන විට තම පවුලේ ජ්‍යේෂ්ඨ සාමාජිකයා මෙන්ම සැන්හෙඩ්‍රිනය නමින් හැඳින්වූ උත්තරීතර සභාවේ සාමාජිකයෙකුද වී සිටීමට හැකියාව තිබිණි.

ආර්විරගස්ගේ මුනුපුරා වන මෙයුරිග්, රෝමයේ ලිනස් බිෂොප්වරයාගේ ලේලිය වන සයිලින් ඇප් කැරඩොග් ගේ දියණිය සමඟ විවාහ විය. ඔවුන් නැවත බ්‍රිතාන්‍යයට පැමිණියේ රෝමවරුන්ගේ සේවාදායක පාලකයන් ලෙසය. මෙයුරිග් සහ ඇය, ග්ලස්ටන්බුරි හි පිහිටි දේවස්ථානය වැඩි දියුණු කළහ. ඔහුව ඉතිහාසය තුල ශාන්ත මාරියස් යනුවෙන් හඳුන්වයි.

එසේම ක්‍රිස්තුස් වහන්සේගේ වංශාවලිය, *දෙවියන් වහන්සේගේ නීතිය (L1)* භාවිතයේ කොටසක් ලෙස බයිබලානුකූල ලෙවී නීතිවල පරිපූර්ණ අදාලත්වය පෙන්නුම් කරයි.

*****

මතෙව්
ඊ. ඩබ්ලිව්. බුලින්ජර් විසිනි

මතෙව්ට අනුව ශුභාරංචිය

සමස්තයක් ලෙස පොතේ ව්‍යුහය.

“බලව නුඹේ රජු” (සෙකරියා 9:9, මතෙව් 21:4)

මතෙව් 1:1 - මතෙව් 2:23. පූර්ව දේවසේවා ක්‍රියාකාරකම්.
මතෙව් 3:1-4 පෙරගමන්කරු.
මතෙව් 3:5-17 බව්තීස්මය: ජලයෙන්.
මතෙව් 4:1-11 පරීක්ෂා කරනු ලැබීම: පාළුකරයේ.
මතෙව් 4:12 - මතෙව් 7:29. දේව රාජ්‍යය
මතෙව් 8:1 - මතෙව් 16:20. රජතුමා
මතෙව් 16:21 - මතෙව් 20:34. රජතුමා
මතෙව් 21:1 - මතෙව් 26:35. දේව රාජ්‍යය
26:36-46 ගෙත්සෙමනෙහි ශෝකාන්විත යාච්ඤාව.
මතෙව් 26:47 - මතෙව් 28:15. බව්තීස්මය: දුක් වේදනා විඳීම (මරණය, භූමදානය සහ නැවත නැඟිටීම, මතෙව් 20:22).
මතෙව් 28:16-18 අනුගාමිකයෝ.
මතෙව් 28:19,20 <u>පශ්චාත් දේවසේවා ක්‍රියාකාරකම්.</u>

මතෙව් ගේ ශුභාරංචිය පිළිබඳ සටහන්

මතෙව්ගේ ශුභාරංචියේ දිව්‍යමය අරමුණ වන්නේ ස්වාමින් වහන්සේව යෙහෝවා ගේ රජු ලෙස ප්‍රකාශ කිරීමයි. එබැවින් උන්වහන්සේගේ දේවසේවයේ සිදු වූ එම සිදුවීම් වෙන් කර අවධාරණය කර ඇති අතර එමඟින් උන් වහන්සේ හා සම්බන්ධ සියලු අනාවැකි ඉටු කිරීමට එවන ලද මෙසියස් ලෙස ඔහුගේ ප්‍රකාශයන් ඉදිරිපත් කරයි. මාර්ක් සහ ලූක් සමඟ සසඳන විට, මතෙව් හට ඔහුගේ ශුභාරංචියට ආවේණික වූ කොටස් තිස් එකකට නොඅඩු ප්‍රමාණයක් ඇත; එලෙසම ඒ කරුණු අනුව ඔහුගේ මෙම ශුභාරංචියේ විශේෂ තැනැත්තන් වන රජු සහ රාජ්‍යය පිළිබඳව අඩු හෝ වැඩි වශයෙන් සඳහන් කරයි.

I. එතුමාගේ ළදරු අවධිය හා සම්බන්ධ සිදුවීම් හතරක්:
ශාස්ත්‍රවන්තන්ගේ පැමිණීම (2:1-15).
බෙත්ලෙහෙමේ සමූලඝාතනය (2:16-18).
මිසරයට පලායෑම (2:19-22).
නාසරෙත් වෙත නැවත පැමිණීම (මතෙව් 2:23).

II. උපමා කථා දහයක්:
කිරිඳි පිළිබඳ උපමාව (13:24-30).
මිදි වත්තේ සේවකයින් පිළිබඳ උපමාව (20:1-16).
සඟවා තැබූ වස්තුව පිළිබඳ උපමාව (මතෙව් 13:44).
පුතුන් දෙදෙනා පිළිබඳ උපමාව (21:28-32).
මුතු ඇටයේ උපමාව (මතෙව් 13:45).
රජුගේ පුත්‍රයාගේ විවාහ මංගල්‍යය පිළිබඳ උපමාව (22:1-14).
මුහුදේ හෙලන ලද දැල පිළිබඳ උපමාව (මතෙව් 13:47).
කන්‍යාවන් දසදෙනා පිළිබඳ උපමාව (25:1-13).
කමා නොවූ දාසයා පිළිබඳ උපමාව (18:23-35).
තලෙන්ත පිළිබඳ උපමාව (25:14-46).

III. ආශ්චර්යයන් දෙකක්:
අන්ධන් දෙදෙනෙකුට පෙනීම දීම (20:30-34).
මාළුවාගේ මුඛයේ තිබූ කාසිය (17:24-27)

IV. විශේෂ දේශනා නවයක්:
කන්ද උඩ දේශනාව (මතෙව් 5-7).
වෙහෙසට පත් වූවන්ට ආරාධනය (11:28-30).
නිෂ්ඵල වචන (මතෙව් 12:36, මතෙව් 12:37).
පේතෘස්ට කල එළිදරව්ව (16:17-19). 147 වන උපග්‍රන්ථය බලන්න.
යටහත් පහත්කම සහ සමාව දීම (18:15-35).
එතුමා එම පරම්පරාව ප්‍රතික්ෂේප කිරීම (මතෙව් 21:43).
විපත් අට (23. 126 වන උපග්‍රන්ථය බලන්න.).
ඔලිව කන්දේදී ප්‍රකාශ කල අනාවැකිය (මතෙව් 25:1-46). 155 වන උපග්‍රන්ථය බලන්න.
කටයුතු පැවරීම සහ පොරොන්දුව (28:18-20). 167 වන උපග්‍රන්ථය බලන්න.

V. එතුමාගේ වධ විඳීම හා සම්බන්ධ සිදුවීම් හයක්:
ජුදාස්ගේ කුමන්ත්‍රණය සහ ඔහුගේ සියදිවි නසාගැනීම (මතෙව් 26:14-16; 27:3-11).
පිලාත්ගේ භාර්යාවගේ සිහිනය (මතෙව් 27:19).
උන් වහන්සේගේ උත්ථානයෙන් පසු සාන්තුවරයන්ගේ නැවත නැඟිටීම (මතෙව් 27:52, මතෙව් 27:53).
එතුමාගේ ශරීරය පිළිබඳ යෝජනා කල කුමන්ත්‍රණය (27:62-64).
සොහොනට යෙදූ මුරකාවල් (මතෙව් 27:65; 66).
මරණින් උත්ථාන වූ දින උදෑසන භූමිකම්පාව (මතෙව් 28:2).

මේවායින් බොහොමයක් මෙම ශුභාරංචියේ විශේෂ අරමුණ හා සමඟ සම්බන්ධ වේ. මෙම ශුභාරංචියට ආවේණික වූ වචන සහ ප්‍රකාශනයන්හිද එම අරමුණම ඇත: එනම් "ස්වර්ග රාජ්‍යය" යන්න, තිස් දෙවතාවක් සඳහන් වන අතර, වෙනත් කිසිම ශුභාරංචියක එය එක් වරක්වත් සඳහන් නොවේ; "ස්වර්ගයේ පියාණන්", එය මතෙව්හි පහළොස් වතාවක්, මාර්ක්හි දෙවරක් පමණක් සඳහන් වන අතර, ලූක්හි එක් වරක්වත් සඳහන් නොවේ; "දාවිත්ගේ පුත්‍රයා", යන්න මතෙව්හි දස වතාවක්, මාර්ක්හි තුන් වතාවක් සහ ලූක්හි තුන් වතාවක් සඳහන් වේ; "ලොකාන්තිමය දක්වා", යන්න සඳහන් වන්නේ මතෙව්හි පමණි; "කියනු ලැබූ දේ ඉටු වන පිණිස", මතෙව්හි නව වතාවක් සඳහන් වන අතර වෙන ශුභාරංචියක එය සඳහන් නොවේ; "කියන ලද කාරණාව", නැතහොත් "විසින් කියන ලද", දහහතර වතාවක් මතෙව් හි සඳහන් අතර වෙනත් ශුභාරංචියක එය සඳහන් නොවේ. එලෙසම, ව්‍යවස්ථාව හා අනාගත වාක්‍යය මුළුමනින්ම මෙසියසේ පැමිණීමෙන් ඉටුවිය යනුවෙන් මතෙව් විසින් පරණ ගිවිසුම පිළිබඳ සඳහන් කිරීම් හැටක් ඇත. rheo යන ක්‍රියා පදය මතෙව්හි විසි වරක් සඳහන්ව ඇත (අනාගත වාක්‍ය වල දහහතර වතාවක් සහ කන්ද උඩ දේශනාවේ හය වතාවක්, "කියමි" ලෙස පරිවර්තනය කර ඇත, මතෙව් 5:21, මතෙව් 5:27, මතෙව් 5:31, මතෙව් 5:33, මතෙව් 5:38, මතෙව් 5:43).

එවැන්ජලිස්තවරුන් ඔවුන්ගේ තොරතුරු ලබාගත්තේ කොහෙන්ද යන්න පිළිබඳ නූතන විවේචකයන්ට ප්‍රශ්නය මතු නොවන්නේ; මන්දයත්, ලූක්ගේ සිද්ධියේදී මෙන් (මතෙව් 1:3), එය ඔවුන්ට එළිදරව් කරන ලද්දේ "ඉහළින්" (ගරා. අනොතෙන්) බැවිනි; එහි සටහන බලන්න. එබැවින් ලූක්ගේ දිව්‍යමය අරමුණ වන්නේ ස්වාමීන් වහන්සේ හුදෙක් "පරිපූර්ණ දෙවියන්" ලෙස ඉදිරිපත් කිරීම නොවේ (ලූක් 1:32-35 සහ යොහන් හි සඳහන් මෙන්); ලූක්ගේ ශුභාරංචියේ එතුමාගේ උපත සහ ළදරු කාලය.
*ලූක් 11:2, "ස්වර්ගයේ ඇති", කොටස සියලු විවේචනාත්මක පාඨ වලින් ඉවත් කර ඇත. උපග්‍රන්ථය - 94 බලන්න. VII.
+ මාර්ක් 13;14, "දානියෙල් අනාගතවක්තෘවරයා විසින් පවසා ඇති ලෙස", සියලුම විවේචනාත්මක පාඨ වලින් ඉවත් කර ඇත උපග්‍රන්ථය - 94 බලන්න. VII.

*****
මතෙව් පරිච්ඡේද 1-4 (සංශෝධිත සම්මත අනුවාදය)

1 වන පරිච්ඡේදය

1 ආබ්‍රහම්ගේ පුත්‍රයා වන දාවිත්ගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පරම්පරාවේ පොතය. 2 ආබ්‍රහම්ට දාව
ඊසාක් උපන්නේය; ඊසාක්ට දාව යාකොබ් උපන්නේය; යාකොබ්ට දාව යූදාද ඔහුගේ සහෝදරයෝද
උපන්නෝය; 3 යූදාට දාව තාමාර්ගෙන් පෙරෙශ්ද ශෙරාද උපන්නෝය; පෙරෙශ්ට දාව හෙශ්‍රොන් උපන්නේය;
හෙශ්‍රොන්ට දාව රාම් උපන්නේය; 4 රාම්ට දාව අමීනාදාබ් උපන්නේය; අමීනාදාබ්ට දාව නාෂොන් උපන්නේය;

නාෂොන්ට දාව සල්මොන් උපන්නේය; 5සල්මොන්ට දාව රාහබ්ගෙන් බෝවාස් උපන්නේය; බෝවාස්ට දාව
රූත්ගෙන් ඕබෙද් උපන්නේය; ඕබෙද්ට දාව යෙස්සේ උපන්නේය; 6යෙස්සේට දාව දාවිත් රජ
උපන්නේය. 7සාලමොන්ට දාව රෙහොබොවම් උපන්නේය; රෙහොබොවම්ට දාව අබියා උපන්නේය; අබියාට
දාව ආසා උපන්නේය; 8ආසාට දාව යෙහෝෂාපාත් උපන්නේය; යෙහෝෂාපාත්ට දාව යෝරාම් උපන්නේය;
යෝරාම්ට දාව උස්සියා උපන්නේය; 9උස්සියාට දාව යෝතාම් උපන්නේය; යෝතාම්ට දාව ආහාස්
උපන්නේය; 10ආහාස්ට දාව හෙසකියා උපන්නේය; හෙසකියාට දාව මනස්සේ උපන්නේය; මනස්සේට දාව
ආමොන් උපන්නේය; ආමොන්ට දාව යොෂියා උපන්නේය; 11බබිලෝනියට ගෙනයාමේ කාලයෙහිදී,
යොෂියාට දාව යෙකොනියාද ඔහුගේ සහෝදරයෝද උපන්නෝය. 12බබිලෝනියට ගෙනයාමට පසු,
යෙකොනියාට දාව ෂෙයල්තියෙල් උපන්නේය; ෂෙයල්තියෙල්ට දාව සෙරුබාබෙල්
උපන්නේය; 13සෙරුබාබෙල්ට දාව අබියූද් උපන්නේය; අබියූද්ට දාව එලියාකීම් උපන්නේය; එලියාකීම්ට දාව
ආශෝර් උපන්නේය; 14ආශෝර්ට දාව සාදොක් උපන්නේය; සාදොක්ට දාව ආකීම් උපන්නේය; ආකීම්ට දාව
එලියූද් උපන්නේය; 15එලියූද්ට දාව එලෙයාසර් උපන්නේය; එලෙයාසර්ට දාව මත්තාන් උපන්නේය;
මත්තාන්ට දාව යාකොබ් උපන්නේය; 16යාකොබ්ට දාව මරියාගේ පුරුෂයාවූ යෝසෙප් උපන්නේය;
මරියාගෙන් ක්‍රිස්තුස් නම්වූ යේසුස්වහන්සේ උපන්සේක. 17මෙසේ ආබ්‍රහම් පටන් දාවිත් දක්වා සියලු පරම්පරා
දසසතරක්ය; දාවිත් පටන් බබිලෝනියට ගෙනයාම දක්වා පරම්පරා දසසතරක්ය; බබිලෝනියට ගෙනයාමේ
පටන් ක්‍රිස්තුස්වහන්සේ දක්වා පරම්පරා දසසතරක්ය. 18යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තිය මෙසේ විය.
උන්වහන්සේගේ මවුවූ මරියා යෝසෙප්ට විවාහබස් දී සිටියදී, ඔවුන් එක්වෙන්ට පළමුවෙන්, ශුද්ධ ආත්මය
කරණකොටගෙන ඈ ගර්භිණීවූ බව දැනගන්නාලදී. 19ධර්මිෂ්ඨයෙක්ව සිටි ඈගේ පුරුෂයාවූ යෝසෙප් ඈ
නින්දාවට පමුණුවන්ට නොකැමතිව, රහසින් ඈ අත්හරින්ට සිතුවේය. 20නුමුත් ඔහු මේ කාරණා
කල්පනාකරමින් සිටියදී, බලව, ස්වාමීන්වහන්සේගේ දූතයෙක් ස්වප්නයකින් ඔහුට පෙනී: දාවිත්ගේ පුත්‍රවූ
යෝසෙප්, නුඹේ භාර්යාවවූ මරියා පාවාගන්ට භය නොවන්න. මක්නිසාද ඈ තුළ පිළිසිඳුණාවූ යමක් ඇද්ද එය
ශුද්ධ ආත්මය කරණකොටගෙනය. 21ඈ පුත්‍රයෙකු වදන්නීය; උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න;
මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාපවලින් ගළවන්නේ උන්වහන්සේයයි කීවේය. 22මේ සියල්ල
සිද්ධවූයේ-බලව, කන්‍යාව ගර්භිණීව පුත්‍රයෙකු වදන්නීය; උන්වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනවා
ඇත 23කියා ස්වාමීන්වහන්සේ අනාගතවක්තෘ ලවා කියෙවූ කීම සම්පූර්ණවන පිණිසය. ඒ නාමයේ අර්ථය නම්
දෙවියන්වහන්සේ අප සමගය යනුයි. 24එවිට යෝසෙප් නින්දෙන් පිබිද, ස්වාමීන්වහන්සේගේ දූතයා ඔහුට
අණකළ ලෙස කරනුයේ, තමාගේ භාර්යාව පාවාගත්තේය; 25නුමුත් ඈ පුත්‍රයෙකු වදන තුරු ඔහු ඈ
නොහැඳින්නේය. ඔහු උන්වහන්සේට යේසුස් යන නාමය තැබීය.

1 වන පරිච්ඡේදයේ අභිප්‍රාය

1-17 පාඨයන් ක්‍රිස්තුස් වහන්සේගේ පෙළපතෙහි විස්තර හා සමග කටයුතු කරයි, එය *මෙසියස්ගේ පෙළපත (අංක 119)* යන පත්‍රිකාවේ දක්වා ඇත. (ලූක් 3:23-38 දක්වාද කියවා බලන්න). එම පත්‍රිකාවේ ආදම්ගේ සිට පැමිණි ගැලවුම්කරුගේ පෙළපතේ වැදගත්කම පැහැදිලි කර ඇත. “මතෙව් 1 සහ ලූක් 3 හි පාඨ පරීක්ෂා කර ඒවා සහ ගණන් කථාවේ පෙනෙන පරස්පරතාවන් ද පැහැදිලි කර ඇත. නිවැරදි හා සැබෑ අර්ථය මගින් පෙන්නුම් කරන්නේ මෙසියස්ව එවා ඇත්තේ පව්කාරයන් ගලවා ගැනීමට බවයි. මෙසියස් යනු කවරෙක්දැයි හඳුනා ගැනීමට මෙසියස්ගේ පෙළපත මහත් උපකරණයකි. වඩාත් වැදගත් දෙය නම්, අනාවැකිවල ඉටුවීම සහ බයිබලානුකූල ව්‍යවස්ථාව පිළිබඳ වැදගත් අවබෝධයක් මෙම පෙළපත් මගින් ලබා දී තිබීමයි.” මෙම පෙළපත දාවිත් රජු හරහා (22:41-45) (රෝම 1:3) ආබ්‍රහම් වෙතට (ගලාති 3:16) දක්වා ඇත. 3-6: රූත් 4:18-22; 1 ලේකම් 2:1-15; 11: බැබිලෝනියට පිටුවහල් කිරීම, 2 රාජාවලිය 24:8-16; යෙරෙමියා 27:20; 12: යෙකොනියා හෝ ජෙහෝයාකිම්, (2 රාජාවලිය 24:6; 1 ලේකම් 3:16). ෂෙයල්තියෙල් සහ පෙදායා ලෙවී සම්භවයක් ඇති පෙළපතක් ගෙන ආවෝය, 1 ලේකම් 3: 16-19; (එස්රා 3:2; හග්ගයි 2:2; ලූක් 3:27 ද බලන්න; ඉහත 119 අනුව සෙරුබ්බාබෙල් වෙත නීත්‍යානුකූලව පැවත එන පෙළපත බලන්න). 13-16: නොඑසේ නම් අබියුද් සිට ජාකොබ් දක්වා සිටි පුද්ගලයින් පිළිබඳව නොදැන සිටීමට ඉඩ තිබුණි (ඉහත 119).16: ක්‍රිස්තුස් යනු අභිෂේක ලත් තැනැත්තා යන අර්ථය ඇති මෙසියස් යන පදයේ ග්‍රීක පරිවර්තනයයි (ලෙවී කථාව 4:3, 5. 16; 2 සාමුවෙල් 1:14- 16)

මාරියම් ශුද්ධ ආත්මය කරණකොටගෙන ගැබ්ගැනීම සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත (18-25 පද).
මෙම කොටසෙහි මතෙව් පෙන්වා දෙන්නේ ශුද්ධ ආත්මය කරණකොටගෙන මාරියම් දරුවෙකු පිළිසිඳගත් බවයි. ඇය ජෝසප් සමඟ විවාහ ගිවිසගෙන සිටි අතර, මාරියම් (මරියා යනුවෙන් වැරදි ලෙස හැඳින්වේ) තමාගේ භාර්යාව ලෙස භාර ගතයුතු බවත්, ඔහු තම පුත්‍රයාට යේසුස් (යාහෝෂුවා හෝ ජෝෂුවා) ලෙස නම් කළයුතු බවත් එතුමා තම සෙනගව පාපයෙන් ගලවා ගන්නා බවත් සහතික කිරීමට සමිඳාණන් වහන්සේගේ දූතයෙක් ඔහුට දර්ශනය විය. යෙසායා විසින්

පවසා තිබූ අනාවැකිය (යෙසායා 7:14) 23 වන පදය ඉටු වීම සඳහා මෙම දේවල් සිදු විය. (ලූක් 1:26 - 2:40 දක්වා කියවන්න).

එහි ප්‍රතිඵලයක් ලෙස ජෝසප් මාරියම් සමඟ විවාහ වූ නමුත් යේසුස් ක්‍රිස්තුස්ගේ උප්පත්තිය සිදුවන තුරු ඔහු ඇයව නොහැඳින්නේය.

20: දේවදූතයන්, ඔවුන් දෙවියන්ගේ පුත්‍රයන් (එලෝහිම්) මිනිසුන් සමඟ දෙවියන් වහන්සේට සේවය කිරීම සඳහා පණිවිඩකරුවන් (හෙබ්‍රෙව් මලක්) ලෙස යවන ලද ආත්මයන්ය.
21: ජේසුස් (ග්‍රීක. අයිසො; හෙබ්‍රෙව්. යහොශුවා නැතහොත් ජෝෂුවා ඉංග්‍රීසියෙන්.) ඇරමයික් සහ හෙබ්‍රෙව් සමාන වන අතර ඒ දෙකෙහිම තේරුම ඔහු ගළවනු ඇත යන්නයි. ඔහු මිනිසුන්ව ඔවුන්ගේ පාපවලින් ගලවා ගැනීමට නියමිත විය.
22-23: කන්‍යාව (යෙසායා 7:14 පැහැදිලි කිරීමේ සටහන් බලන්න. සංශෝධිත සම්මත අනුවාදය)
25: රෝමානු කතෝලිකයන් කියා සිටින්නේ සෙමිටික් ව්‍යවහාරයේ ‘දක්වා’ යන වචනයෙන් ක්‍රිස්තුස් වහන්සේගේ උපතෙන් පසුව ඔවුන් ලිංගික සම්බන්ධතා පැවැත්වූ බවක් අදහස් නොවන බවයි. වෙනත් බොහෝ නිකායන් එම අර්ථය පිළිනොගන්නා අතර බයිබලය එම පාඨය වෙනත් ආකාරයකින් දක්වයි.

2 වන පරිච්ඡේදය

[1]තවද හෙරොද් රජුගේ දවස්වල යුදයේ බෙත්ලෙහෙම්හි යේසුස්වහන්සේ උපන් කල, පූර්වදිශාවෙන්
ශාස්ත්‍රවන්තයෝ යෙරුසලමට ඇවිත්: [2]යුදෙව්වරුන්ට රජව උපන් තැනන්වහන්සේ කොතැන්හිද? මක්නිසාද
අපි උන්වහන්සේගේ තාරකාව පූර්වදිශාවෙහිදී දැක, උන්වහන්සේට නමස්කාර කරන පිණිස ආවෙමුයයි
කීවෝය. [3]හෙරොද් රජ ඒ ඇසූ කල්හි ඔහුද ඔහු සමග මුළු යෙරුසලමද කැලඹුණෝය. [4]එකල ඔහු සියලු නායක
පූජකයන්ද සෙනඟගේ ලියන්නන්ද රැස්කරවා, ක්‍රිස්තුස්වහන්සේ කොතැන්හි උපදිනසේක්දැයි ඔවුන්ගෙන්
විචාළේය. [5]ඔව්හු කථාකොට: යුදයේ බෙත්ලෙහෙම්හිය, කුමක් හෙයින්ද- [6]එම්බා බෙත්ලෙහෙම, යුදා දේශය,
තී යුදාගේ අධිපතීන් අතරෙහි කොයි ලෙසකින්වත් ඉතා කුඩා නොවන්නීය. මක්නිසාද මාගේ ඉශ්‍රායෙල් සෙනඟ
පාලනයකරන්නාවූ ආණ්ඩුකාරයෙක් තී කෙරෙන් නික්මෙනේනේයයි අනාගතවක්තෘ විසින් ලියා තිබේයයි ඔහුට
කීවෝය. [7]එකල හෙරොද් ශාස්ත්‍රවන්තයන් රහසින් කැඳවා, තාරකාව කොයි කාලයෙහි පෙනුණේදැයි
හරියාකාරයෙන් ඔවුන්ගෙන් දැනගෙන: [8]නුඹලා ගොස් ඒ ළදරුවා ගැන හරියාකාරයෙන් විභාගකරපල්ලා;
නුඹලාට සම්බවූ කල, මාත් ගොස් උන්වහන්සේට නමස්කාරකරන පිණිස මට දන්වාපල්ලාය කියා, ඔවුන්
බෙත්ලෙහෙමට යැවීය. [9]ඔව්හු රජුගේ බස් අසා පිටත්ව ගියෝය; බලව, පූර්වදිශාවෙහිදී ඔවුන් දුටු තාරකාව
ළදරුවා උන් තැන මුදුනට පැමිණ නවතින තුරු ඔවුන්ට පෙරටුව ගියේය. [10]ඔව්හු තාරකාව දැක ඉතා මහත්
ප්‍රීතියකින් ප්‍රීතිවූවෝය. [11]ඔව්හු ගෙට වැද, ළදරුවා ස්වකීය මවුවූ මරියා සමග සිටිනවා දැක, බිම වැටී
උන්වහන්සේට නමස්කාර කොට, තමුන්ගේ කරඬු හැර, රන්ද කට්ටකුමංචල්ද සුවඳ ලාටුද යන පඬුරු
උන්වහන්සේට පිදුවෝය. [12]තවද හෙරොද් වෙතට නැවත නොයන ලෙස දෙවියන් වහන්සේ විසින්
ස්වප්නයකින් දන්වනු ලැබ, ඔව්හු අන් මගකින් තමුන්ගේ රටට ගියෝය. [13]ඔවුන් ගිය කල්හි ස්වාමීන්
වහන්සේගේ දූතයෙක් ස්වප්නයකින් යෝසෙප්ට පෙනී: නැගිට ළදරුවාද උන්වහන්සේගේ මෑණියන්ද රැගෙන
මිසරයට පලාගොස්, මා නුඹට කියන තුරු එහි සිටපන්න. මක්නිසාද හෙරොද් ළදරුවා විනාශකරන්ට
සොයනවා ඇතැයි කීවේය. [14]ඔහු නැගිට රාත්‍රියෙහි ළදරුවාද උන්වහන්සේගේ මෑණියන්ද රැගෙන මිසරයට
ගොස්, [15]හෙරොද්ගේ මරණය දක්වා එහි සිටියේය. මෙසේ වූයේ: මිසරයෙන් මාගේ පුත්‍රයා කැඳවාගතිමියි කියා
ස්වාමීන් වහන්සේ විසින් අනාගතවක්තෘ කරණකොටගෙන කියන ලද කීම සම්පූර්ණවන පිණිසය. [16]එකල
හෙරොද් ශාස්ත්‍රවන්තයන් විසින් තමා රවටනු ලැබූ බව දැක, ඉතා උදහස්ව, ඔවුන්ගෙන් හරියාකාර දැනගත්
කාලයේ හැටියට, මනුෂ්‍යයන් යවා, බෙත්ලෙහෙම්හිද එහි සියලු සීමාවලද සිටි දැවුරුදු වයස්වූද ඊට බාලවූද
සියලු පිරිමි දරුවන් මැරෙවුවේය. [17]එකල: හැඬීමේද බොහෝ වැලපීමේද හඬක් රාමාහි ඇසුණේය; රාබෙල්
ඇගේ දරුවන් ගැන අඬමින්, ඔවුන් නැති නිසා සැනසෙන්ට නොකැමතිවූවායයි [18]අනාගතවක්තෘවූ යෙරෙමියා
කරණකොටගෙන කියන ලද කාරණාව සම්පූර්ණ විය. [19]නුමුත් හෙරොද් මැරුණායින් පසු, බලව, ස්වාමීන්
වහන්සේගේ දූතයෙක් මිසරයෙහිදී ස්වප්නයකින් යෝසෙප්ට පෙනී: [20]නැගිට ළදරුවාද උන්වහන්සේගේ
මෑණියන්ද රැගෙන ඉශ්‍රායෙල් දේශයට පලයන්න. මක්නිසාද ළදරුවාගේ ජීවිතය නසන්ට සෙවූ අය මළෝයයි
කීවේය. [21]එවිට ඔහු නැගිට ළදරුවාද උන්වහන්සේගේ මෑණියන්ද රැගෙන ඉශ්‍රායෙල් දේශයට
ආවේය. [22]එහෙත් අර්කෙලාවුස් තමාගේ පියවූ හෙරොද් වෙනුවට යුදය කෙරෙහි රජකම්කරන බව ඔහු අසා,
එහි යන්ට භයව, දෙවියන් වහන්සේ විසින් ස්වප්නයකින් දන්වනු ලැබ, ගලීලයේ පළාත්වලට
ගොස්, [23]නාසරෙත් නම් නුවරට පැමිණ, එහි වාසයකළේය. මෙසේ වූයේ: උන්වහන්සේ නාසරියයෙක්යයි
කියනු ලබනසේකැයි අනාගතවක්තෘවරුන් කරණකොටගෙන කියනලද කාරණාව සම්පූර්ණවන පිණිසය.

2 වන පරිච්ඡේදයේ අභිප්‍රාය

ජේසුස් වහන්සේ (යාහෝෂුවා හෝ ජෝෂුවා) උපත ලැබුවේ හෙරොද් රජුගේ කාලයේ යුදයේ බෙත්ලෙහෙමේය (v.1). හෙරොද් මිය ගියේ අබිබ් 1-14 ක්‍රිස්තු පූර්ව 4 වන අතර මෙලෙස ක්‍රිස්තුන් වහන්සේගේ උපත ක්‍රි.පූ. 4 ජනවාරි මසට පසු වීමට ඉඩක් නොමැත (*[බව්තීස්මයේදී ක්‍රිස්තුන් වහන්සේගේ වයස සහ එතුමා දේවසේවයේ යෙදුන කාලසීමාව (අංක 019)]* බලන්න). ශාස්ත්‍රවන්තයෝ (මැගි - පුරාණ පර්සියාවේ උගත් බාණ්ඩයක්) යුදෙව්වරුන්ට රජව උපන් තැනන්වහන්සේට නමස්කාර කරන පිණිස ආවෙමු යයි කී අතර (1-2 පද; යෙරෙමියා 23:5; ගණන් කථාව 24:17 බලන්න) හෙරොද් ඒ අසා කනස්සල්ලට පත් වූ අතර (3 පදය) ජෙරුසලමේ නායක පූජකයන් සහ විනයධරයින් විසින් මීකා 5:2 හි අනාවැකිය පිළිබඳව ඔහුට දන්වනු ලැබීය (4-6 පද) (යොහාන් 7:42 බලන්න). හෙරොද් ශාස්ත්‍රවන්තයන්ට උපදෙස් දුන්නේ දරුවා සොයාගෙන ඔහු සිටින ස්ථානය හෙරොද්ට දැනුම් දෙන ලෙසයි. ශාස්ත්‍රවන්තයෝ රත්රන්, කට්ටකුමංජල් සහ සුවඳ ලාටු තෑගි වශයෙන් රැගෙන තාරකාව පසුපස ගියහ. යෙරුසලමට ආපසු නොයන ලෙස ඔවුන්ට අනතුරු අඟවන ලද අතර ඔවුන් නැවත ඔවුන්ගේ රටට ගියෝය (7-12 පද) (ලූක් 2:7 සටහන් බලන්න).

දරුවා මරා දැමීමට හෙරෝද් අදහස් කරගෙන සිටි බැවින් මිසරයට පලායන ලෙස යෝසෙප්ට පවසන ලදී. හෙරොද්ගේ මරණය දක්වා ඔවුහු මිසරයේ රැඳී සිටියහ. මෙලෙස සිදුවූයේ හොෂෙයා 11: 1 හි සඳහන් "මිසරයෙන් මාගේ පුත්‍රයා කැඳවාගතිමිය" යන අනාවැකිය, ඉටුවීම සඳහාය. (13-15 පද) (නික්මයාම 4:22 බලන්න).

16-18 පදවල වයස අවුරුදු 2 සහ ඊට අඩු සියලුම ළමයින් මරා දැමීම ගැන සඳහන් කරයි. ඔහුව රැවටීම ගැන හෙරොද් ශාස්ත්‍රවන්තයින් සමඟ කෝපයට පත්ව ඔවුන් තාරකාව පළමුවරට දුටු කාල වකවානුව සැලකිල්ලට ගෙන බෙත්ලෙහෙම සහ ඊට ආසන්න ප්‍රදේශයයන්හි වයස අවුරුදු දෙකක් සහ ඊට අඩු වයසේ වූ සියලුම පිරිමි ළමයින් ඝාතනය කළේය.

මෙය යෙරෙමියා 31:15 (18 වන පදය) හි සඳහන් පහත අනාවැකිය ඉටුවීමකි.

"වැලපීමද දුක්ඛිත ඇඬීමද සහිතවූ හඬක් රාමාහි ඇසෙයි, රාබෙල් ඇගේ දරුවන් ගැන අඬමින් ඔවුන් නැති නිසා ඇගේ දරුවන් ගැන සැනසෙන්ට අකමැතිව සිටියි."

රාමා පිහිටා ඇත්තේ ජෙරුසලමේ සිට සැතපුම් 5 ක් පමණ උතුරු දෙසින්ය. යාකොබ්ගේ භාර්යාව වන රාබෙල්, දරු ප්‍රසූතියේදී මිය ගිය අතර බෙත්ලෙහෙම අසල ඇයව තැන්පත් කරන ලදී (උත්පත්ති 35:16-20 බලන්න). ජෙරුසලමට උතුරින් පිහිටි රාමා යනු සතුරෙකු විසින් ඇති කරන ලද ජාතික ශෝකයේ ස්ථානයයි (යෙරෙමියා 40:1), මෙහිදී එය ඉදුමීය ජාතිකයෙකුවූ හෙරොද් විය.

ක්‍රිස්තු පූර්ව 4 ට පෙර ක්‍රිස්තුස් වහන්සේ උපත ලැබූ අතර හෙරොද්ගේ මරණය 1-13 අබිබ් අතර, ක්‍රිස්තු පූර්ව 4 දී සිදු විය. මෙම සිදුවීම්වල කාල පරාසය *[බව්තීස්මයේදී ක්‍රිස්තුන් වහන්සේගේ වයස සහ එතුමා දේවසේවයේ යෙදුන කාලසීමාව (අංක 019)]* යන පත්‍රිකාවේ දක්වා ඇත.

19-23 පදවල පවුල ඊශ්‍රායලය වෙත නැවත පැමිණීම විස්තර කරයි. හෙරොද්ගේ පුත් අර්කෙලාවුස් යුදා දේශය (ක්‍රි.පූ. 4 - 6 ක්‍රි.ව.) පාලනය කරන බව දැනගත් යෝසෙප් ගලීලයට ගොස් නාසරෙත්හි පදිංචි විය.

branch (අන්කුරය) යන වචනය සඳහා වූ හෙබ්‍රෙව් වචනයට ඇරමයික් නාසරෙත් භාෂාවේ ශබ්දය මෙන්ම බොහෝ විට අර්ථයෙහි සමානකමක් තිබේ (යෙසායා 11:1 බලන්න).

3 වන පරිච්ඡේදය

1ඒ දවස්වලදී යොහන් බව්තීස්ත* ඇවිත් යුදයේ වනයෙහි දේශනා කරමින්: 2පසුතැවිලිවෙයල්ලා; මක්නිසාද
ස්වර්ගරාජ්‍යය ළඟයයි කීවේය. 3කුමක් හෙයින්ද- ස්වාමීන්වහන්සේගේ මාර්ගය පිළියෙළ කර උන්වහන්සේගේ
මාවත් සමතලා කරපල්ලාය කියා වනාන්තරයෙහි හඬගසන්නෙකුගේ ශබ්දයයයි අනාගතවක්තෘවූ යෙසායා
කරණකොටගෙන කියනලද්දේ මොහු ගැනය. 4මෙම යොහන් ඔටුරෝම වස්ත්‍ර හැඳ, ඉඟටියේ හම්පටියක් බැඳ
සිටියේය; ඔහුගේ කෑම වූයේ පළඟැටියන් හා වනමීය. 5එකල යෙරුසලමේද මුළු යුදයේද යොර්දාන අවට මුළු
පළාතේද වැසියෝ ඔහු වෙතට පැමිණ, 6තමුන්ගේ පව් කියාදෙමින්, යොර්දාන් ගංගාවෙහි ඔහුගෙන්
බව්තීස්මය* ලැබුවෝය. 7නුමුත් ඔහු තමාගෙන් බව්තීස්මය* ලබන පිණිස ඵරිසිවරුන්ගෙන්ද සද්දූසිවරුන්ගෙන්ද
බොහෝ දෙනෙකු එනවා දැක, ඔවුන්ට කථාකොට: පොළොංවංශය, පැමිණෙන උදහසින් පලායන්ට නුඹලාට
අවවාදකළේ කවුද? 8එබැවින් ආබ්‍රහම් අපගේ පියාණෝයයි කියාගන්ට නොසිතා, පසුතැවිල්ලට සුදුසු ඵල
උපදවාපල්ලා. 9මක්නිසාද මේ ගල්වලින් ආබ්‍රහම්ට දරුවන් උපදවා දෙන්ට දෙවියන්වහන්සේට පුළුවනැයි
නුඹලාට කියමි. 10තවද දැනටම පොරොව ගස් මුලට තබා තිබේ. එබැවින් හොඳ ඵල නොදරන සියලු ගස් කපනු
ලැබ ගින්නෙහි දමනු ලැබේ. 11මම වනාහි පසුතැවිල්ල පිණිස නුඹලා වතුරෙන්* බව්තීස්මකරමි. නුමුත් මට පසුව

එන තැනැත්තේ මට වඩා බලවත්ය, මම උන්වහන්සේගේ වහන් ගෙනයන්ට වත් නොවටිමි. උන්වහන්සේ
ශුද්ධ ආත්මයෙන්ද ගින්නෙන්ද නුඹලා බව්තීස්ම කරන සේක*. 12උන්වහන්සේගේ කුල්ල තමන්වහන්සේගේ
අතේය, උන්වහන්සේ තමන් කමත හොඳ හැටි පවිත්‍රකරන සේක; තමන් ධාන්‍ය අටුවට රැස්කොට, බොල්
නොනිවෙන ගින්නෙන් දවනසේකැයි කීවේය. 13එකල යේසුස්වහන්සේ යොහන්ගෙන් බව්තීස්මය* ලබන
පිණිස ගලීලයේ සිට යොර්දානට ආසේක. 14නුමුත් යොහන් උන්වහන්සේ වලක්වමින්: ඔබගෙන්
බව්තීස්මය* ලබන්ට මට යුතුව තිබියදී ඔබ මා වෙතට එනසේක්දැයි කීවේය. 15යේසුස් වහන්සේ ඔහුට
උත්තරදෙමින්: දැනට ඉඩහරින්න. මක්නිසාද මෙසේ සියලු ධර්මිෂ්ඨකම් සම්පූර්ණකරන්ට අපට සුදුසුයයි
කීසේක. එවිට ඔහු උන්වහන්සේට ඉඩහැරියේය. 16යේසුස්වහන්සේ බව්තීස්ම* ලැබ එකෙණෙහිම දියෙන්
ගොඩනැගුණු සේක. බලව, අහස උන්වහන්සේට විවරවිය, දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරෙවියෙකු
මෙන් බසිනවාද තමන් පිටට පැමිණෙනවාද උන්වහන්සේ දුටුසේක; 17තවද: මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය,
මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි අහසෙන් හඬක් විය.

3 වන පරිච්ඡේදයේ අභිප්‍රාය

යොහන් බව්තීස්තගේ පසුබිම් කතාව ලූක් 1 පරිච්ඡේදයේ දක්වා ඇත. 1-3 පද අනුව යොහාන් යුදයේ පාළුකරයේ දේශනා කරමින්, යෙසායා විසින් පුරෝකථනය කරන ලද ස්වර්ග රාජ්‍යයේ පැමිණීම ආසන්න වීම ගැන මිනිසුන්ට අනතුරු හැඟවීය (යෙසායා 40: 3)

> මක්නිසාද යත්, අනාගතවක්තෘ යෙසායා විසින් "කාන්තාරයෙහි ස්වාමීන් වහන්සේගේ මාර්ගය සාදා, අපේ දෙවියන් වහන්සේට වනයෙහි මාවතක් සමතලා කරපල්ලා" කියා පැවසූ විට යෙසායා කතා කළේ ඔහු ගැනය (3 වන පදය).

යොහාන් පසුතැවිලි වීම ගැන දේශනා කළේය. පසුතැවීම යන්නෙන් අදහස් කරන්නේ දෙවියන් වහන්සේ සහ මිනිසා අතර ඇති ගිවිසුමට ඇත්ත වශයෙන් නැවත යාමයි (නික්මයාම 19:3-6; 24:3-8; යෙරෙමියා 31:31-34). 4 වන පදය මගින් ඔහු ඇඳ සිටි ඇඳුම සහ ඔහුගේ ආහාර පිළිබඳ විස්තර කරයි (2 රාජාවලිය 1:8; සෙකරියා 13:4 සහ යෙසායා 40:3, මලාකි 3:1 බලන්න) (3:3 පදය සහ 17:10-12 ද බලන්න). මලාකි 4:5 හි අදහස් කරන්නේ අවසාන දිනවලදී පැමිණීමට නියමිත අනාගතවක්තෘ එලියා පිළිබඳවය (*සාක්ෂිකරුවන් දෙදෙනා (අංක 135)*; සහ *අවසාන යුද්ධයන් II කොටස: සාක්ෂිකරුවන්ගේ දින 1260 (අංක 141D)*) යෙරුසලමේ සහ යුදා දේශයේ සිටි බොහෝ අය ඔහුගේ පණිවිඩය ඇසීමට ඔහු වෙත පැමිණ ජෝර්දාන් ගඟේ බව්තීස්මය ලැබූහ (5-6 පද) (මාර්ක් 1:4 ද බලන්න).

පරිසිවරු සහ සද්දුසිවරු ඔහු වෙතට පැමිණි විට, ඔහු කෝප වී, "පොළොංවංශය, පැමිණෙන උදහසින් පලායන්ට නුඹලාට අවවාද කළේ කවුද?" කියා කීවේය. මෙය දෙවියන් වහන්සේගේ විනිශ්චය මතක් කරදෙයි (1 තෙසලෝනික 1:10) (22:23; සහ ක්‍රියා 23:6-10 බලන්න). පලස්තීනයේ තුන්වන යුදෙව් නිකායක් වූයේ එසෙන් ය. (ජෝසේපස් බී. ජේ. 11.8. 2-13 බලන්න). මළ මුහුදේ ලියවිලි (DSS) ඔවුන්ගේ ක්‍රියාවන් හා ව්‍යවහාරයන් පිළිබඳව යම් ආලෝකයක් විහිදුවන අතර, නමුත් මෙම පදය මුලින් පැමිණියේ සිරියාවේ මිථ්‍යාදෘෂ්ටික නිකායක් වූ ජ්ලිනි හරහා වන අතර, කුම්රාන් නිකාය තමන් එසෙන් ලෙස හඳුන්වාගනු නොලබන අතර එම යෙදුම ප්‍රතික්ෂේප කරනු ඇත.

යොහාන් රාජ්‍යය ගැන කතා කළේය (4:17 ද බලන්න). පසුතැවිල්ලට සුදුසු ඵල උපදවන ලෙස ලෙස ඔහු ඔවුන්ට අනතුරු ඇඟවීය. දෙවියන් වහන්සේට ගල්වලින් ආබ්‍රහම්ට දරුවන් උපදවා දිය හැකි බැවින් ආබ්‍රහම් ඔවුන්ගේ පියා ලෙස ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් නොවන බවද ඔහු කීය (7-9 දක්වා පද). මෙය ශුභාරංචි වල සැබෑ අරමුණ වන අන්‍යජාතීන්ගේ ගැලවීම පෙන්වා දීමයි. යොහාන් තවදුරටත් අනතුරු අඟවන්නේ දැනටමත් පොරොව ගස් මුල වලට තබා තිබෙන බවත් ඵලදාව නැති ගස් කපා දමනු ලබන බවත්ය (10 පදය) (ලූක් 3:7-9; යොහාන් 8:33 බලන්න).

ඔහුගේ බලපෑමේ තරම කොතරම්ද කියා දැනගැනීම සඳහා ක්‍රියා 18:25; 19:1-7 බලන්න. පසුතැවිලි වීම සඳහා යොහාන් වතුරෙන් බව්තීස්මය දුන් අතර, එන තැනැත්තා තමාට වඩා බලවත් බවත්, තමා එතුමාගේ පාවහන් ගෙනයාමට වත් සුදුසු නොවන බවත් ප්‍රකාශ කළේය.

ක්‍රිස්තුස් වහන්සේ ශුද්ධ ආත්මයෙන් හා ගින්නෙන් බව්තීස්ම කරනු ඇත (11 වන පදය). එබැවින් *ශුද්ධ ආත්මය (අංක 117)* පිළිබඳව මෙම ලිපියෙන් හඳුන්වා දී ඇත.

> ජැමෙයිසන්, ෆවුසෙට් සහ බ්‍රවුන් ඔවුන්ගේ අටුවාවෙහි 12 වැනි පදය ගැන මෙලෙස පවසයි.
> "**උන්වහන්සේගේ කුල්ල** - බොල් ඉවත් කරන කුල්ල.
> **තමන්වහන්සේගේ අතෙහිය** - භාවිතයට සූදානම්ව ඇත. මෙය ශුභාරංචිය දේශනා කිරීම පිළිබඳව හැර වෙන කිසිවක් පිළිබඳව නොවේ, එනම් දැනතාමත් පටන් ගෙන, එහි ප්‍රතිඵලය වනුයේ ආත්මික වශයෙන් නොවටිනා වූ බොල් වැනි ද්‍රව්‍ය, තිරිඟු වැනි ඝන ද්‍රව්‍යයන්ගෙන් වෙන් කිරීමයි. (මලාකි 3:1-3 හි සමාන ඉදිරිපත් කිරීම

සසඳන්න).

උන්වහන්සේ තමන් කමත හොඳ හැටි පවිත්‍රකරනසේක - කමත, ගොයමින් ධාන්‍ය වෙන් කරන ස්ථානය නොහොත් කමත. එනම්, ඇසට පෙනන්නාවූ සභාවයි.

සහ තම ධාන්‍ය - සැබෑ හෘද සාක්ෂියක් ඇති එතුමාගේ ශුද්ධවන්තයින්; ඔවුන්ගේ ශක්තිමත් වටිනාකම නිසා එලෙස හැඳින්වේ (ආමොස් 9:9; ලූක් 22:31 සසඳන්න).

අටුවට රැස් කර - "ඔවුන්ගේ පියාණන් වහන්සේගේ රාජ්‍යය", මෙම "අටුව" හෝ "ධාන්‍යාගාරය" ලෙස හඳුන්වන දෙය අපගේ ස්වාමීන් වහන්සේ විසින් තිරිඟු සහ කිරිදි පිළිබඳ උපමාවෙන් අලංකාර ලෙස පැහැදිලි කර ඇත (මතෙව් 13:30, මතෙව් 13:43).

බොල් - ස්ථිර ආගමික මූලධර්ම සහ චරිතයෙන් තොර ආගම පිළිබඳ හිස්, හරයක් නොමැති මහාචාර්යවරු, (ගීතාවලිය 1:4 බලන්න).

නොනිවෙන ගින්නෙන් දවනසේක - ඒකීය ස්වභාවයෙන් ඇති මේ වචන වල රූප ස්වභාවය එකින් එක සැසඳීමේදී ඒවායේ ඇති එකිනෙකට විරුද්ධ බව පැහැදිලි වේ: - පුළුස්සා දැමීමට, නමුත් නොනිවෙන ගින්නක් සමඟ; එකක් මගින් කෙනෙකුගේ සැබෑ ජීවිතය සමන්විත වන සියල්ල මුළුමනින්ම විනාශ කිරීම ප්‍රකාශ කරයි, අනෙක එම භයානක තත්වය තුළ දිගින් දිගටම සිටීම පිළිබඳ අඛණ්ඩ සිහි කල්පනාව පැවතීම. ලූක් 3:18-20; 12:49; ක්‍රියා 2:17-21; 18:24-26; 19:1-7 බලන්න.

13 සිට 17 පද දක්වා ක්‍රිස්තුස් වහන්සේගේ බව්තීස්මය සම්බන්ධව ලියා දක්වයි. යොහාන් සිතුවේ තමා නුසුදුසු කෙනෙකු නිසා ක්‍රිස්තුස් වහන්සේ විසින් තමාව බව්තීස්ම කළ යුතු බව වන අතර ක්‍රිස්තුස් වහන්සේ පසුතැවිල්ලේ බව්තීස්මයේ අවශ්‍යතාවය අවධාරනය කරමින්, "දැනට ඉඩහරින්න. මක්නිසාද මෙසේ සියලු ධර්මිෂ්ඨකම් සම්පූර්ණකරන්ට අපට සුදුසුයයි" කියා කීසේක. යේසුස් වහන්සේ වතුරෙන් ගොඩට එන විට දෙවියන් වහන්සේගේ ආත්මය පරෙවියෙකු මෙන් ස්වර්ගයෙන් බැස තමා මතට එනු දුටු සේක. එවිට "මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය, මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි." කියා හඬක් ඔවුන්ට ස්වර්ගයෙන් ඇසිණි. (17 පදය). (මාර්ක් 1:9-11; ලූක් 3:21-22; යොහාන් 1:31-34 ද බලන්න). මෙසේ ක්‍රිස්තුස් වහන්සේගේ මෙහෙවර බලයෙන් තහවුරු කරන ලදී.

පසුතැවිලි වීම සහ බව්තීස්මය (අංක 052) පත්‍රිකාවෙන්, පසුතැවිලි වී බව්තීස්ම වීමේ අවශ්‍යතාවය සහ පාස්කුව සහ නැවත නැඟිටීම දක්වා ලබා නොදිය යුතු, ශුද්ධ ආත්මය පිළිගැනීම සඳහා අත් තැබීමේ වැදගත්කම පැහැදිලි කරන (*කුරුසියේ ඇණ ගැසීම සහ නැවත නැඟිටීම (අංක 159)*) අතරම පසුව ක්‍රිස්තුන් වහන්සේව දෙවියන් වහන්සේගේ සිංහාසනය මත *එලයේ පූජාව ලෙස පිළිගැනීම (අංක 106B)* සහ ක්‍රි.ව. 30 දී පෙන්තකොස්ත දින එය සභාවට භාරදීම විස්තර කෙරේ. මේ සියල්ල *දෙවියන්ගේ දින දර්ශනයට (අංක 156)* අනුව සිදු කළ යුතු විය.
යොහාන් විසින් ක්‍රිස්තුස් වහන්සේගේ බව්තීස්මය සිදු කරනු ලැබුවේ තිබෙරියස් ගේ 15 වන වසරේදී හෝ ක්‍රි.ව. 27 වූ අතර, එය තම වරදවල් පිළිබඳව පසුතැවිලිවීමේ ස්වාමීන් වහන්සේට පිළිගත හැකි වසර ලෙස ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ කළ ජුබිලි වර්ෂයේදීය. එතුමාගේ දේව සේවය ආරම්භ වූයේ වර්තමාන කාලයේ 28 වන වසරේ පාස්කු මංගල්‍යයෙන් පසු *ජෝනාගේ ලකුණ (අංක 013)* අනුව යොහාන් සිරගත කිරීමෙන් පසුවය. *දෙවියන් වහන්සේගේ ගිවිසුම (අංක 152)* රැක ගැනීමට සහ ආත්මය දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ රඳවා ගැනීම සඳහා වැඩිහිටි බව්තීස්මය සහ ශුද්ධ ආත්මය ලැබීම අවශ්‍ය බව සලකන්න. දැන් අපට පහත දැක්වෙන 4 වන පරිච්ඡේදයෙන් පෙනෙන පරිදි මෙමගින් දෙවියන් වහන්සේගේ සභාවේ මෙහෙවර ආරම්භ කළේය.

4 වන පරිච්ඡේදය

1 එකල යේසුස්වහන්සේ යක්ෂයා විසින් පරීක්ෂාකරනු ලබන පිණිස ආත්මය විසින් වනාන්තරයට පමුණුවනු
ලැබූසේක. 2 උන්වහන්සේ දාවල් සතළිසක්ද රෑ සතළිසක්ද නිරාහාරව හුන් පසු, උන්වහන්සේට
බඩගිනිවිය. 3 එවිට පරීක්ෂකයා උන්වහන්සේ වෙතට ඇවිත්: ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම් මේ ගල්
රොටි වෙන්ට අණකරපන්නැයි කීවේය. 4 උන්වහන්සේ උත්තරදෙමින්: මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ
මුඛයෙන් නික්මෙන සියලු වචනවලින් ජීවත්වෙනවා මිස, රොටි පමණකින් ජීවත් නොවන්නේය කියා ලියා
තිබේයයි කීසේක. 5 එවිට යක්ෂයා උන්වහන්සේ ශුද්ධ නුවරට පමුණුවා දේවමාළිගාව මුදුනෙහි සිටුවා: 6 ඔබ
දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම් පහතට පනින්න. කුමක් හෙයින්ද- උන්වහන්සේ තමන් දූතයන්ට නුඹ ගැන
අණදෙනසේක. නුඹේ පය යම් හෙයකින් ගලක නොවදින පිණිස ඔව්හු තමුන්ගේ අත්පිට නුඹ උසුලා
ගන්නෝය කියා ලියා තිබේයයි උන්වහන්සේට කීවේය. 7 යේසුස්වහන්සේද: තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ
පරීක්ෂා නොකරව කියාත් ලියා තිබේයයි ඔහුට කීසේක. 8 නැවතත් යක්ෂයා උන්වහන්සේ ඉතා උස් කන්දකට
පමුණුවා, ලෝකයේ සියලු රාජ්‍යයන්ද එහි ඓශ්වර්යයද උන්වහන්සේට පෙන්වා: 9 ඔබ බිම වැටී මට
නමස්කාරකරන්නෙහි නම් මේ සියල්ල ඔබට දෙන්නෙමියි උන්වහන්සේට කීවේය. 10 එවිට යේසුස්වහන්සේ:
සාතන් අහක්ව යව. මක්නිසාද-තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට නමස්කාරකරව, උන්වහන්සේට පමණක්
සේවයකරවයි ලියා තිබේයයි ඔහුට කීසේක. 11 එකල යක්ෂයා උන්වහන්සේ අත්හැර ගියේය; බලව,

දේවදූතයෝ ඇවිත් උන්වහන්සේට උපස්ථාන කළෝය. 12යොහන් පාවාදෙනු ලැබූ බව උන්වහන්සේ අසා
අහක්ව ගලීලයට ගියසේක. 13උන්වහන්සේ නාසරෙත් නුවර හැර, සාබුලොන් සහ නප්තලීයේ සීමාවල
මුහුදුබඩ තිබෙන කපර්ණවුමට පැමිණ, එහි වාසයකළසේක. 14මෙසේ කළේ- යොර්දාන් එගොඩ මුහුද අසබඩ
සාබුලොන් රටද නප්තලී රටද වන අන්‍ය ජාතීන්ගේ ගලීලයෙහි, 15අන්ධකාරයෙහි හුන් සෙනඟ මහත්
ආලෝකයක් දුටුවෝය, මරහුගේ දේශයෙහිද සෙවණෙහිද හුන්නවුන්ට ආලෝකය
උදාවූයේයයි 16අනාගතවක්තෘවූ යෙසායා කරණකොටගෙන කියනලද කාරණාව සම්පූර්ණවන පිණිසය.
යේසුස්වහන්සේ දේශනාකරන්ට පටන්ගැනීම.17එතැන් පටන් යේසුස්වහන්සේ: පසුතැවිලිවෙයල්ලා; මක්නිසාද
ස්වර්ග රාජ්‍යය ළංවී තිබේය කියා දේශනාකරන්ට පටන්ගත්සේක. 18උන්වහන්සේ ගලීලයේ මුහුදුබඩ
ඇවිදිනසේක්, මසුන් අල්ලන්නන්ව සිටියාවූ සහෝදරයන් දෙදෙනෙක් වන පේත්‍රුස් නම්ලත් සීමොන්ද ඔහුගේ
සහෝදරවූ අන්ද්‍රෑද මුහුදේ දැලක් හෙළනවා දැක: 19මා පස්සේ වරෙල්ලා, මම නුඹලා මනුෂ්‍යයන් අල්ලන්නන්
කරන්නෙමියි ඔවුන්ට කීසේක. 20එකෙණෙහිම ඔව්හු දැල් අත්හැර උන්වහන්සේ අනුව
ගියෝය. 21උන්වහන්සේ එතැනින් ගොස් තවත් සහෝදරයන් දෙදෙනෙක් වන සෙබදීගේ පුත්‍රවූ යාකොබ්ද
ඔහුගේ සහෝදරවූ යොහන්ද තමුන්ගේ පියවූ සෙබදී සමග ඔරුවේ හිඳ දැල් හරිගස්සනවා දැක, ඔවුන්ට
අඬගැසූසේක. 22එකෙණෙහිම ඔව්හු ඔරුවද තමුන්ගේ පියාද අත්හැර උන්වහන්සේ අනුව ගියෝය. 23තවද
යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද රාජ්‍යයේ ශුභාරංචිය දේශනාකරමින්ද සෙනඟ අතරෙහි
සියලු ආකාර ලෙඩ හා සියලු ආකාර රෝග සුවකරමින්ද ගලීලය මුළුල්ලෙහි ඇවිද්දසේක. 24උන්වහන්සේගේ
කීර්තිය සිරියා රට මුළුල්ලෙහි පතළව ගියාය. නොයෙක් රෝගපීඩාවලින් පීඩිතවූ සියලු රෝගීහුද
යක්ෂාවේශවූවෝද මීමස්මර රෝගීහුද අංශභාග රෝගීහුද උන්වහන්සේ වෙතට ගෙනෙනලද්දෝය;
උන්වහන්සේ ඔවුන් සුවපත්කළසේක. 25ගලීලයෙන්ද දෙකපොලිසෙන්ද යෙරුසලමෙන්ද යුදයෙන්ද යොර්දාන්
එගොඩින්ද බොහෝ සමූහයෝ උන්වහන්සේ අනුව ගියෝය.

4 වන පරිච්ඡේදයේ අභිප්‍රාය

1 සිට 11 දක්වා පදවල පාළුකරයේදී ක්‍රිස්තුස් වහන්සේගේ පරීක්ෂාවට ලක්වීම විස්තර කරයි. මෙයද යක්ෂයා වන සාතන් නොහොත් වරද කිරීමට පොළඹවන්නා ගේ විනිශ්වයකි (3, 10 පද) (මාර්ක් 1:12-13; ලූක් 4:1-13; හෙබ්‍රෙව් 2:18; 4:15 බලන්න). නපුර යනු දෙවියන් වහන්සේට සතුරු පුද්ගලික කැමැත්තකි (ලූක් 13:11, 16 බලන්න.)
2 වන පදය; දින හතළිහක නිරාහාරය (නික්මයාම 34:28; 1 රාජාවලිය 19:8 බලන්න)
3 වන පදය; ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම්, 3:17 හි දෙවියන් වහන්සේගේ ප්‍රකාශය බලන්න.
4 වන පදය - ද්විතීය කථාව 8:3 බලන්න.
5 වන පදය - ශුද්ධ නගරය ජෙරුසලම
6 පදය - ගීතාවලිය 91:11-12
7 වන පදය - ද්විතීය කථාව 6:16
10 වන පදය - ද්විතීය කතාව 6:13; 11:13.
12-17 පද වලින් යොහාන් බව්තීස්ත සිරගත කිරීම පිළිබඳව සඳහන් කරනු ලබන අතර ක්‍රිස්තුස් වහන්සේ එතුමාගේ දේවසේවය ආරම්භ කිරීම පිළිබඳව ද සඳහන් කරයි. යෙසායා 9:1-2 හි සඳහන් අනාවැකිය ඉටු වීම සඳහා එතුමා ගලීලයෙන් පිටත් වී සාබුලොන් සහ නප්තලී ප්‍රදේශයේ කපර්ණවුමට ගොස් දේශනා කිරීමට හා පසුතැවිලි වීම සඳහා කැඳවීමට පටන් ගත්සේක. (මාර්ක් 1:14-15; ලූක් 4. :14-15 බලන්න).
15-16 පද - යෙසායා 9:1-2.
මතෙව්, දේව රාජ්‍යය යන්න වෙනුවට ස්වර්ග රාජ්‍යය යන්න භාවිතා කරයි.

යෝනාගේ ලකුණ සහ දේවමාළිගාව ප්‍රතිසංස්කරණය කිරීමේ ඉතිහාසය (අංක 013) මගින් අපට මෙම සිදුවීම්වල කාලසීමාවන් දැකගත හැක.
“ක්‍රිස්තුස් වහන්සේ එතුමාගේ දේවසේවය ආරම්භ කළේ යොහාන් බව්තීස්ත ඉගැන්වීමට පටන් ගැනීමෙන් පසුවය. යොහාන් තම ඉගැන්වීම ආරම්භ කළේ තිබේරියස් සීසර්ගේ පාලන සමයේ 15 වන වසරේදීය. සෙනෙට් සභාව ප්‍රකාශ කල දෙයට වඩා, ටිෂ්රි (සැප්තැම්බර්/ඔක්තෝබර්) හි ආරම්භ වන සිවිල් වර්ෂය සහ ඔගස්ටස්ගේ මරණයෙන් පසු තිබේරියස්ගේ පාලනය ආරම්භ වූ දිනය භාවිතා කරමින්, මේ සඳහා ගත හැකි මුල්ම දිනය ක්‍රි.ව. 27 ඔක්තෝබර් (*කුරුසයේ ඇණ ගැසීමේ සහ නැවත නැඟිටීමේ කාල ප්‍රාන්තරය (අංක 159)* බලන්න) වේ. ජේසුස් වහන්සේ බව්තීස්ම වීමට පැමිණෙන විට යොහාන් කලක සිටම බව්තීස්ම කරමින් සිටි බව අපි දනිමු. විශේෂයෙන්, ඔහුගේ බව්තීස්ම කාලවකවානුවේ සිට ක්‍රි.ව. 28 පාස්කුව දක්වා වූ දින අපට ප්‍රතිනිර්මාණය කළ හැකි අතර එය ආසන්න වශයෙන් දින පනහක පමණ කාලයකි. මතෙව් 4:17 පදයෙන් අප දන්නා පරිදි, යොහාන් සිරගත කරන තුරු යේසුස් වහන්සේ සිය දේවසේවය ආරම්භ නොකළේය (මතෙව් 4:12). ක්‍රි.ව. 28 පාස්කුවෙන් පසු, යේසුස් වහන්සේ සහ එතුමාගේ ගෝලයන් යුදා දේශයේ බව්තීස්ම කරමින් සිටි බව යොහන් 3:22 පදයෙන් පැහැදිලි වේ (ක්‍රිස්තුස් වහන්සේ විසින් බව්තීස්ම

නොකළත් (යොහන් 4:2)). යොහාන් මේ වනවිටත් සිරගත කර නොතිබූ අතර සලීම් අසල ඒනොන්හි බව්තීස්ම කරමින් සිටියේය (යොහන් 3:23-24). මේ අනුව, ක්‍රිස්තු වර්ෂ 28 පාස්කුව පසු වනතුරු ක්‍රිස්තුස් වහන්සේ එතුමාගේ දේවසේවය ආරම්භ කර නොතිබුණේය. මෙසේ ක්‍රිස්තුස් වහන්සේට දේව සේවය සඳහා තිබුනේ වසර දෙකකට අඩු කාලයකි. යොහාන් බව්තීස්තගේ දේවසේවය සහ ඔහු විසින් කරන ලද බව්තීස්ම සහ ඔහුගේ ගෝලයන් තෝරාගැනීම සමඟ එකට ගත්කල, ඔහුගේ දේවසේවය වසර දෙකහමාරක් විය. මෙය යෝනාගේ අනාවැකිය වූ දිනකට අවුරුද්දක් යන මූලධර්මය මත විය.

මතෙව්, දෙවියන් වහන්සේගේ නීතියේ ආධිපත්‍යයේ යථාර්ථය (ලූක් 10:18; 11:20: 17:21 කියවන්න) සහ එහි අනාගත අවබෝධය සහ යෙදුම් (මතෙව් 6:10; මාර්ක් 1:15 සටහන්) පිළිබඳව ඉගැන්වීය.
18-22 පද - මාර්ක් 1:16-20; ලූක් 5:1-11; යොහාන් 1:35-42 බලන්න.
24 පදය - ඩීමෝනිඇක්ස් යන්නෙන් අදහස් කරනුයේ භූතයන් හෝ නපුරු ආත්මයන් විසින් පාලනය කරනු ලබන පුද්ගලයන්ය (මතෙව් 8:16,28; 9:32; 15:22; මාර්ක් 5:15; ලූක් 13, 16, සටහන් කියවන්න). භූතයන් - ලූක් 4:33 බලන්න.
25 පදය - දෙකාපොලිස්. මාර්ක් 5:20 සටහන් බලන්න

මතෙව් 1-4 පරිච්ඡේද පිළිබඳ බුලින්ගර්ගේ සටහන්. (ජේම්ස් රජතුමාගේ අනුවාදය සඳහා)

1 වන පරිච්ඡේදය

1 වන පදය
මාතෘකාව. බලයලත් අනුවාදයේ සහ සංශෝධිත අනුවාදයේ ඇති අලුත් ගිවිසුමේ පොත්වල මාතෘකා මුල් පිටපතේ පොත්වල කොටසක් නොවේ.
ශුභාරංචිය. ඇන්ග්ලෝ-සැක්සන් God spell = දෙවියන් පිළිබඳ විස්තරයක්: එනම් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය. "Gospel" යන ඉංග්‍රීසි වචනය, ශුභාරංචිය යන තේරුම හඟවන ග්‍රීක euaggelion යන වචනය සමඟ කිසිදු සම්බන්ධයක් නැත, එය = ප්‍රීතිමත් ආරංචි යන අදහස දෙන අතර එය එලෙස භාවිත වේ. මෙය ක්‍රි.පූ. 9, ප්‍රීන් හි වෙළඳපොලේ ඇති ශිලා ලේඛනයක (දැන් සැම්සුන් කාලේ, මයිකේල් අසල අයෝනියාවේ පුරාණ නගරයකි) සහ වසර 250කට පසුව ලිපියක (පැපිරස්) විස්තර වී ඇති අතර මේ ලේඛන දෙකම දැන් බර්ලිනයේ රාජකීය පුස්තකාලයේ ඇත.
අනුව = එනම් වාර්තා කර ඇත යන්නයි. ග්‍රීක. kata. උපග්‍රන්ථය - 104. බලයලත් අනුවාදයේ සහ සංශෝධිත අනුවාදයේ ඇති පරිදි "සාන්තුවරයා" යන මාතෘකාව, පල්ලියේ කථිකාචාර්යවරුන්ගෙන් ව්‍යුත්පන්න වූ පසුකාලීන එම්එස්එස් හි පමණක් හමු වූ ශීර්ෂයන්ගේ වැරදි පරිවර්තනයකි; එය "මතෙව්ට අනුව ශුද්ධ වූ ශුභාරංචිය" ලෙස පරිවර්තනය කර තිබිය යුතුය. සංශෝධිත අනුවාදය "මතෙව්ට අනුව ශුභාරංචිය"; L Tr. T සහ WH හි "මතෙව්ට අනුව" ලෙස දක්වා ඇත; දෙවැන්න hagion = ශුද්ධ යන වචනය මග හැර ඇත.
මතෙව්. උපග්‍රන්ථය - 141 බලන්න. උත්පත්ති පොතේ අදහස්. පළමු මිනිසා සහ දෙවන මිනිසා සම්බන්ධයෙන් පමණක් සිදු වේ (උත්පත්ති 5:1 සහ මතෙව් 1:1).
පරම්පරාව = පෙළපත හෝ පරම්පරාව. උපග්‍රන්ථය - 99 බලන්න. හෙබ්‍රෙව් ප්‍රකාශනයේද එකම අර්ථය ඇත (උත්පත්ති 5:1).
යේසුස් ක්‍රිස්තුස්: එනම් දැන් උත්කෘෂ්ට කරන ලද නිහතමානී තැනැත්තා. උපග්‍රන්ථය - 98 බලන්න.
දාවිත්ගේ පුත්‍රයා. මක්නිසාද යත් දාවිත් හට කෙලින්ම පොරොන්දු වූ බැවිනි (2 සාමුවෙල් 7:12, 2 සාමුවෙල් 7:16). ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ මෙම ප්‍රකාශනය නව වතාවක් මතෙව් හි සඳහන් කර ඇත. (මතෙව් 1:1; මතෙව් 9:27; මතෙව් 12:23; මතෙව් 15:22; මතෙව් 20:30, මතෙව් 20:31; මතෙව් 21:9, මතෙව් 21:15; මතෙව් 22:42). ගීතාවලිය 132:11 යෙසායා 11:1. යෙරෙමියා 23:5. ක්‍රියා 13:23. රෝම 1:3 ද සසඳන්න. දාවිත්ගේ, සිංහාසනයේ උරුමක්කාරයා. උපග්‍රන්ථය - 98. දාවිත්ගේ නම අලුත් ගිවිසුම ආරම්භයේ ඇත. එලෙසම අවසානයේදී (එළිදරව් 22:16) ද ඇත.
අබ්‍රහම්ගේ පුත්‍රයා. මන්ද ඔහුට පොරොන්දු වූ ආකාරයට (ලූක් 1:73), ආබ්‍රහම් විසින් මෙන්ම දාවිත් විසින් ප්‍රීතියෙන් පිළිගනු ලැබූ බැවිනි (යොහාන් 8:56. යොහාන් 22:43). උත්පත්ති 12:3; උත්පත්ති 22:18. ගලාති 1:3, ගලාති 1:16 සසඳා බලන්න. දේශයේ උරුමක්කාරයා (උත්පත්ති 15:18). උපග්‍රන්ථය - 98.

2 වන පදය
ආබ්‍රහම්. උත්පත්ති 21:2, උත්පත්ති 21:3. රෝම 9:7, රෝම 9:9.
